# SOUTH EASTERN UNIVERSITY OF SRI LANKA

## SECOND YEAR EXAMINATIONS IN BACHELOR OF ARTS (EXTERNAL)
## 2009 / 2010 HELD IN DECEMBER - 2010

## SIN 2.15 – SINHALA GRAMMAR AND WRITING

Answer any **five** questions only. Time: 03 Hours

---

1. සම්මත සිංහල හෝඩිය ලියන්න.

2. පහත සඳහන් වාක්‍ය සුදුසු ආඛ්‍යාත පද යොදා සම්පූර්ණ කරන්න.

I. ඔහු රජුන් හමු වී තොරතුරු ..........................
II. රජ ඇමැත්තෝ ඒ සියල්ල අසා ....................
III. කුමාරවරු සටනට සූදානම් ..........................
IV. බිසොව කුමාරවරු ..........................
V. ස්ත්‍රීහු බිසොවුන් ..........................
VI. මුව රළ වන ගොමුවේ ..........................
VII. සොර මුළ අන්සතු දේ පැහැර ..........................
VIII. සිසු කැළ අකුරු ..........................
IX. හංස සමූහය විලෙහි ..........................
X. තරු කැළ අහසේ ..........................
XI. ගෙවල් පෙළ වතුරින් ..........................
XII. තාරකාවෝ අහසේ ..........................
XIII. තුරුහු මලින් ..........................
XIV. ගංගාවෝ මුහුද කරා ....................
XV. මල්ලිකාවෝ මල් ..........................
XVI. මිනිසා කුඹුර ..........................
XVII. ළමයා අකුරු ..........................
XVIII. කුමාරයා යුදයට ..........................
XIX. මම පාසලට ..........................
XX. අපි සෙල්ලම් ..........................

3.

(අ) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

I. බල්ලෝ සාවුන් මරති.
II. මම පොත් කියවමි.
III. දෙවියෝ මා රැක ගත්හ.
IV. සිංහයෙක් මුවකු මැරීය.
V. සිවල්ලු හාවුන් අල්ලති.

(ආ) පහත වැකිවල හිස් තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

I. පොලිස් භටයන් විසින් ...................... (සොරෙකු/සොරෙක්/සොරුන්) ලුහු බඳිනු ලැබීය.
II. (ළමයි/ළමයෙක්/ළමයින්) ...................... විසින් පොත් පාඩම් කරන ලදී.
III. උපාසිකාව විසින් ධර්මය ශ්‍රවණය ........................... (කරයි/කරති/කෙරිණ)
IV. බළලකු විසින් ............................ (මීයෙක්/මීයන්/මීයෝ) අල්ලනු ලබති.
V. (මිනිසා/මිනිසා විසින්/මිනිස්සු) ........................... ගස් කැපේ.

4. (අ) විභක්ති යන්නේ අරුත කුමක්ද?

(ආ) "දරු" ශබ්දය විභක්ති නවයේ වර නගා ලියන්න.

5. (අ) පහත සඳහන් පුරුෂ ලිංග පදවල ස්ත්‍රී ලිංග පද ලියන්න.

බළලා, කවුඩා, වස්සා, කුකුළා, ඌරා, කුක්කා, කොල්ලා, සොරා, ප්‍රිය, මනමාලි, කුමරා, සුද්දා, පාලක, රජ, ගැටයා, සිටු, ස්වාමි, අශ්වයා, මුවා

(ආ) මුවා, මීයා, මින්නේරිය, වැද්දා, දිග, ආහාර, ගුරුතුමිය, සුදු, ළමයා, පාසල, වෙළඳසැල, බේසම, ළිඳ, ඉත්තෑවා, හාවා, පොල් ගෙඩිය, අම්මා, වාහනය, ගොවියා, මොණරා, මිනිසා, කෞතුකාගාරය, මහත, අයියා, පන්සල, හොඳ, රෝහල, සුවඳ, කීකරු, පිඟාන, අලියා,

ඉහත දී ඇති නාම පද පහත වගුවේ ගැළපෙන තීරුවල ලියන්න.

| ප්‍රාණවාචී නාම පද | | අප්‍රාණවාචී නාම පද | | |
|---|---|---|---|---|
| මිනිස් | සතුන් | ද්‍රව්‍ය | ස්ථාන | ගුණ |
| | | | | |

6. (අ) පහත සඳහන් නාමයන්හි අර්ථය වැඩි වන සේ සු, අභි, අබි යන උපසර්ගයක් යොදන්න.

මංගල, නන්දන, රූපිකාව, අන්තර, අවකාශ උදය, මධුර, සංයෝගී, විනීත, රූපී, භාෂිතය, රස

(ආ) පහත සඳහන් පදවල උපසර්ග වෙන් කරන්න.

සුපිරිසිදු, ඉපැරණි, ප්‍රමෝද, ප්‍රබල, අතිගරු, සුවිනීත, අභිනව, අභිවර්ධන, සම්මිශ්‍රණය, අධිශීලය, ඉමහත්, සංයුක්ත, සපිරි, සහජාත

7. පහත දැක්වෙන වාක්‍යවල යෙදී ඇති නාම විශේෂණ තෝරා ලියන්න.

1. සැම කළු වළාවකම රිදී රේඛාවක් ඇත.
2. නිසල දිය බොහෝ ගැඹුරුය.
3. චතුර කථිකත්වය උදාර නායකත්වයේ ලක්ෂණයකි.
4. අසාධ්‍ය රෝගියා මහ රෝහලට ඇතුළත් කරනු ලැබිණ.
5. සුන්දර දිය ඇලි මනහර දසුන් මවයි.

6. පැරණි නටබුන් අතරින් වටිනා රන් පිළිමයක් හමු විය.
7. කුඩා දරුවෝ පැණි රස ප්‍රිය කරති.
8. නවීන විද්‍යාව මිනිස් කාර්යයන් වඩා පහසු කොට තිබේ.
9. පෙරදිග නාට්‍යය සැම දෙනාගේම මහත් ප්‍රශංසාවට ලක් විය.
10. නිහඬ වන පෙත තුළ දී මිහිරි ගී ගයන කුරුළු වර්ග රැසක් අපට හමු වූහ.
11. රජය අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා විශාල සහන ලබා දේ.
12. හදිසි අනතුරින් ඔහුට බරපතල තුවාල සිදු විය.
13. ඉන්දියාව විශාල ජනගහනයක් සහිත සන්ධීය රාජ්‍යයකි.
14. අලුත් එළවළුවල වැඩි පෝෂ්‍ය ගුණයක් ඇතැයි සැලකේ.
15. වළවේ ගඟ සමනල කන්දෙන් ආරම්භ වේ.

8. රටක සංවර්ධනයට සාමය අවශ්‍යම සාධකයක් වේ යන මාතෘකාව යටතේ කෙටි රචනාවක් ලියන්න.